# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල
## (සංස්ථාගත කිරීමේ)

**ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා විසින්
2023 දෙසැම්බර් මස 12 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 දෙසැම්බර් මස 05 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

**[204 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල
# (සංස්ථාගත කිරීමේ)

## ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහා මීන් පෙර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කාමිණී දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 78 දරන භාර ඔප්පුව මගින් (මෙතැන් සිට "ඔප්පුව" ලෙසින් හඳුන්වනු ලබන) අරමුදලක් ස්ථාපිත කර ඇති අතර එය මෙහි උපලේඛනයෙහි දක්වා ඇත:

එකී භාර අරමුදලේ ඉලක්ක සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික පරිත්‍යාග මගින් ප්‍රමාණවත් අරමුදල් සාර්ථකව එකතු කර ඇති අතර එකී භාර අරමුදල මීන් මතු විස්තර කෙරෙන විධිවිධාන අනුව සංස්ථාගත කිරීම සඳහා භාරකරුවන් විසින් අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අතර එම අයදුම්පත සඳහා අනුමතිය ලබාදීම මහජන යහපත සඳහා වනු ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන "ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල් පනත" ලෙස සඳහන් කළ හැක.

ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම

**2.** මෙම පනත ආරම්භ කළ දින සිට සහ ඉන්පසුව, ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල, "ප්‍රඥාබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල" (මෙතැන් සිට "අරමුදල" ලෙසින් හඳුන්වනු ලබන) නාමය සහ විලාසම යටතේ සදාතන අනුප්‍රාප්තිකත්වය සහිත සංස්ථාපිත ආයතනයක් විය යුතු අතර එම නමින් පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ භාවිතා කිරීමට පූර්ණ බලය සහ අධිකාරීත්වය සහිතව සියලුම අධිකරණයන්හි නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට හැකි වනු ඇත.

අරමුදලේහි භාරකාර මණ්ඩලය

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මීන් මතු විධිවිධාන සපයා ඇති පරිදි පිහිටුවා ඇති භාරකාර මණ්ඩලයකට පැවරිය යුතුය.

මණ්ඩලය, ප්‍රතිලාභීන් සහ ඒ සඳහා හිමිකම් ඇති සියලුම පුද්ගලයන්, ප්‍රදාන සහ එනයින් සංස්ථාපිත හෝ ලියා සහතික කරන ලද ඕනෑම අතිරේක හෝ සංශෝධිත සාධන පත්‍රයක් ඇතුළුව නිසි ලෙස ලියා සහතික කරනු ලබන එවැනි ඔප්පු සඳහා පිළිවෙළින් පාර්ශ්වකරුවන් විය යුතුය.

(2) අරමුදලේ භාරකාර මණ්ඩලය (මින්මතු "මණ්ඩලය" වශයෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය;-

(අ) නිර්මාතෘ;

(ආ) සභාපති;

(ඇ) (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

(ii) අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා,

ලෙස තත් කාලයේ තනතුරු දරන පුද්ගලයන්; සහ

(ඈ) වසර පහක කාලයක් සඳහා නිර්මාතෘ විසින් පත් කරන ලද පුද්ගලයන් පස් දෙනෙකු (මින්මතු පත්කළ සාමාජිකයන් වශයෙන් හඳුන්වනු ලබන)

කෙසේ වෙතත්, ඔප්පුවේ 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති භාරකරුවන් හැර දැනට සිටින භාරකරුවන් දෙදෙනා මෙම පනත යටතේ පත් කළ පළමු සාමාජිකයන් ලෙස සැලකිය යුතුය.

නිර්මාතෘවරයාගේ අභාවයෙන් පසු භාරකරුවන් විසින් ඉහත "(ඈ)" හි සඳහන් පරිදි භාරකරුවන් පත් කළ යුතුය.

නිර්මාතෘ හෝ ඔහුගේ නාමිකයා හෝ නාමිකයාගේ නාමිකයා අරමුදලේ සභාපති විය යුතුය.

(3) මණ්ඩලයේ පළමු රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින්ගෙන් එක් අයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතුය.

(4) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයෙකුට ඕනෑම අවස්ථාවක සභාපතිවරයා වෙත අමතන ලද ලිඛිත සන්නිවේදනයක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැක.

(5) යම් තැනැත්තකු,-

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක බලාත්මක ඕනෑම නීතියක් යටතේ බුන්වත් වූ හෝ බංකොලොත් වූ අයෙක් බවට ප්‍රකාශ කර ඇති, නිදහස් නොකළ බුන්වත් වූ හෝ බංකොලොත් වූ තැනැත්තෙකු; හෝ

(ආ) සදාචාර විරෝධය හා සම්බන්ධ සහ මාස හයකට නොඅඩු කාලයක් සඳහා සිරගත කිරීම සහිත දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු වූ තැනැත්තෙකු; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ බලාත්මක ඕනෑම නීතියක් යටතේ, දුබල මනසක් හෝ මානසික ඌනතාවක් ඇති බවට තීරණය කළ හෝ ප්‍රකාශ කළ තැනැත්තෙකු; හෝ වන්නේ නම්, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ අඛණ්ඩව ධුරයේ කටයුතු කිරීමට නුසුදුසු විය යුත්තේය.

(6) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයෙකු ඔහුගේ නිල කාලය අවසන් වීමට පෙර මරණයෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් ආකාරයකින් ඔහුගේ නිලය හිස් වන්නේ නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තම පූර්වගාමියාගේ නිල කාලයෙහි කල් ඉකුත් නොවූ කොටස සඳහා නිලය දැරිය යුත්තේ ය.

මණ්ඩලයේ සාමාජිකයන්, අන්‍යාකාරයකින් තීරණය නොකළහොත්, භාරය අත්හිටුවන තෙක් අඛණ්ඩව තනතුරේ සිටිය යුතුය.

(7) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. ඕනෑම රැස්වීමකට සභාපතිවරයා නොමැති අවස්ථාවක, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින් විසින් එම රැස්වීම සඳහා තමන් අතරින් සභාපතිවරයෙකු තෝරා ගත යුතුය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර ඕනෑම මතභේදයක් ඇති වුවහොත්, බහුතරයේ තීරණයට බැඳී සිටිය යුතු සහ බලාත්මක විය යුතුය.

(9) තම සාමාජිකයන් අතර කිසියම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක් හෝ ක්‍රියාදාමයක් අවලංගු ලෙසට නොසැලකිය යුතුය.

(10) මණ්ඩලයේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් හතර දෙනෙකු විය යුතුය.

(11) (10) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට එහි රැස්වීම සහ එවැනි රැස්වීම්වල වාර්තා සටහන් සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටිය නියාමනය කිරීමට රීති සම්පාදනය කළ හැකිය.

අරමුදලේ මුද්‍රාව

**4.** අරමුදලේ මුද්‍රාව:-

(අ) මණ්ඩලය විසින් වරින් වර තීරණය කරනු ලබන පරිදි යම් පුද්ගලයෙකු භාරයේ තිබිය යුතුය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කළ හැක; සහ

(ඇ) මණ්ඩලයේ අනුමතිය ඇතිව සහ ඔවුන්ගේ ඉදිරියේ සංකේතයක් ලෙස ලේඛනයට අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරියේ හැර කිසිදු ලේඛනයකට මුද්‍රාව නොතැබිය යුතුය.

අරමුදලේ ඉලක්ක සහ අරමුණු

**5.** අරමුදලේ ඉලක්ක සහ අරමුණු විය යුත්තේ:-

(අ) තම ප්‍රාථමික අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති සුදුසුකම් ලත් තරුණ තරුණියන්ට, තත්ත්වය අනුව, ඔවුන්ගේ කාර්මික සහ/ හෝ තාක්ෂණික සහ/ හෝ වෘත්තීය කුසලතා සහ තාක්ෂණික සහ/ හෝ උසස් අධ්‍යාපන ආයතනයක නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි ශිෂ්‍යත්ව ලබා දීම;

(ආ) වෙනත් අධ්‍යාපන ක්ෂේත්‍ර සහ/ හෝ ආයතන සහ/ හෝ තාක්ෂණික කළමනාකරණ සහ/ හෝ උසස් අධ්‍යාපන ආයතන, පාසල්, පදනම් සහ අධ්‍යාපනයේ සහ/ හෝ වෙනත් උසස් අධ්‍යාපනයේ ඉදිරි ගමනේ නියැලී සිටින ඒ හා සමාන ආයතන පිහිටුවීම සහ/ හෝ පිහිටුවීමට සහාය වීම;

(ඇ) කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ තාක්ෂණික අධ්‍යාපනයේ දියුණුවෙහි නියැලී සිටින එවැනි පුද්ගලයින්ගේ කුසලතා සහ නිපුණතා සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම;

(ඈ) අරමුදලේ ඉලක්ක සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලුම සහ/ හෝ වෙනත් දේවල් කිරීම.

මණ්ඩලයේ බලතල සහ කාර්යයන්

**6.** (1) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය, හෝ ඊට හිතකර හෝ ආනුෂාංගික සියලු දේ කිරීමට අරමුදලේ නාමයෙන් මණ්ඩලයට බලය තිබිය යුතුය.

;-

(2) උපවගන්තිය (1) මගින් ප්‍රදානය කරන ලද බලතලවල සාමාන්‍යභාවයට අගතියකින් තොරව, මණ්ඩලයට පහත බලතල සහ කාර්යයන් තිබිය යුතුය.

(අ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් අරමුදල් රැස් කිරීමට සහ මුදල් හෝ ද්‍රව්‍ය වශයෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට;

(ආ) මෙම පනත මගින් හෝ කිසියම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, බූදලය භාරදීමක් හෝ වෙනත් ආකාරයකින් එයට පැවරෙන ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට හෝ දරා සිටීමට සහ අරමුදල හිමිකම් ලබන ඕනෑම දේපළක් විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, ප්‍රදානය කිරීමට, පැවරීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමට;

(ඇ) අරමුදලේ අරමුණු වැඩිදියුණු කිරීම සඳහා දේශීය වශයෙන් සහ විදේශයන්හි ප්‍රදාන, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව ලබා දීමට;

(ඈ) අරමුදලේ බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාවට නංවා, ක්‍රියාත්මක කර ඉටු කිරීම සඳහා සහ එහි අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට සෘජුව හෝ මණ්ඩලය විසින් ඒ වෙනුවෙන් ලිඛිතව බලය පවරන ලද නිලධාරීන් සහ සේවකයන් හෝ නියෝජිතයන් හරහා ඇතුළු වී ඉටු කිරීමට;

(ඉ) මෙම පනතේ විධිවිධානවලට යටත්ව, අරමුදලේ නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ වේතන ලබා දීම සහ එහි සේවකයින් පත් කිරීම, උසස් කිරීම, වේතනය සහ විනය පාලනය සහ ඔවුන්ට නිවාඩු සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධයෙන් නීති රීති සකස් කිරීම;

(ඊ) අරමුදලට අයත් හෝ සතු ඕනෑම ඉඩමක කිසියම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යූහයක් ඉදිකිරීමට හෝ ඉදිකරවීමට හේතු;

(උ) භාර මුදල් ඇතුළු මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය පවරන ලද යම් ආයෝජනයන්හි මණ්ඩලයේ අභිමතය පරිදි අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සහ එවැනි ආයෝජනයක් නැවත කැඳවීම, නැවත ආයෝජනය කිරීම සහ වෙනස් කිරීම. එවැනි ආයෝජනවලින් උපයන ආදායම් එකතු කිරීම මණ්ඩලයේ අභිමතය පරිදි වන්නේ ය;

(ඌ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම සහ අරමුදලේ අරමුණු සඳහා අරමුදලේ දේපළ ඇපයක් ලෙස හෝ එවැනි ඇපයක් නොමැතිව ණයට ගැනීම හෝ මුදල් රැස්කිරීම;

(එ) භාරය වෙනුවෙන් මණ්ඩලයට ඕනෑම සමාගමකින් පුද්ගලයකුගෙන්, ව්‍යාපාරික ආයතනයකින් හෝ ව්‍යාපාරයකින් බැංකු, මූල්‍ය හෝ ආයෝජන උපදෙස්, නීති උපදෙස් හෝ ඊට අදාළ ඕනෑම සේවාවක් සම්බන්ධයෙන් සාධාරණ ලෙස උපදෙස් ලබා ගත හැකි අතර උපදේශන ගාස්තු සියල්ල භාරය විසින් දරනු ලැබේ; සහ

මණ්ඩලයට අවශ්‍ය නම්, නීති උපදේශකයෙකු පත් කළ හැකිය. ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන නමුත් ආරාධිතයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී විය යුතුය. එකී උපදේශකවරයාට භාරයට අදාළ කිසිවක් සම්බන්ධයෙන් නොව උපදෙස් සම්බන්ධයෙන් පමණක් තීරණ ගැනීමට බලය ඇත්තේය.

(ඒ) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආනුෂංගික හෝ හිතකර අනෙකුත් සියලුම ක්‍රියා සහ දේවල් කිරීමට.

**7.** අරමුදලට ගෙවනු ලබන ලැබීම්:— අරමුදලට ගෙවීම්

(අ) දේශීයව හෝ විදේශයන්හි සිට ලබාගත් යම් අරමුදල් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ සාක්ෂාත් කර ගත් හෝ එකතු කරන ලද මුදල්;

(ආ) අරමුදලේ ඉලක්ක සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා කලින් කලට රජයෙන් ලැබෙන යම් ප්‍රදානයක්; සහ

(ඇ) අරමුදලට ලැබිය යුතු ආයෝජන හෝ වෙනත් ලැබීම් වලින් ලැබෙන ඕනෑම ආදායමක්

**8.** අරමුදලෙන් ගෙවනු ලැබීම්:— අරමුදලෙන් ගෙවීම්

(අ) අරමුදලේ වැඩ කිරීම, පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වියදම්;

(ආ) නිලධාරීන්, සේවකයින් සහ අනෙකුත් සේවකයින් සඳහා වැටුප් ගෙවීම; සහ

(ඇ) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය විසින් අනුමතය කරන ලද අනෙකුත් සියලුම ගෙවීම්.

සංස්ථාවේ කොන්ත්‍රාත් ලෙස සලකනු ලබන භාරකාර අරමුදලේ කොන්ත්‍රාත්

**9.** මෙම පනත ක්‍රියාත්මක වීමට එළඹෙන අවස්ථාවේ පවතින එකී භාර අරමුදලේ සියලුම කොන්ත්‍රාත්තු, ගිවිසුම්, ණය සහ වගකීම් මෙයින් පිහිටුවන ලද සංස්ථාවේ කොන්ත්‍රාත්තු, ගිවිසුම්, ණය සහ වගකීම් ලෙස සැලකිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) අරමුදලේ ආදායම් හා වියදම්, වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියලුම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය වග බලා ගත යුතු ය.

(2) මණ්ඩලය විසින් සෑම වසරකම දෙසැම්බර් තිස්එක්වැනි දිනට තම පොත් සමතුලිත කිරීමට වග බලා ගත යුතු අතර, ඊළඟ මාර්තු තිස්එක්වන දිනට පෙර, මුලින්ම සඳහන් කළ දිනය දක්වා ඇති අරමුදලේ වත්කම් සහ වගකීම්වල සාරාංශය අඩංගු කරන ලද ආදායම් සහ වියදම් ගිණුමක් සහ ශේෂ පත්‍රයක් සකස් කිරීමට වග බලා ගත යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් අත්සන් කිරීමට බලය දුන් මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතු ය.

අරමුදලේ මුදල් වර්ෂය

**11.** අරමුදලේ මූල්‍ය වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

යම් තීරු බදු සහ බදුවලින් අරමුදල නිදහස් කිරීම

**12.** (1) අරමුදලේ ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනයන කරන ඕනෑම භාණ්ඩලයක් සඳහා තීරු සහ ආනයන බදු ගෙවීමෙන් අරමුදල නිදහස් කළ යුතු ය.

(2) 2021 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු කිසියම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් අරමුදල නිදහස් කළ යුතු ය.

(3) යම් තැනැත්තෙකු අරමුදලට ත්‍යාගයක් කරන විට, ඔහු තෑග්ගේ මුළු වටිනාකම ප්‍රමාණයට 2021 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බදු ගෙවීමෙන්, නිදහස් කළ යුතු ය.

(4) කිසියම් පුද්ගලයෙකු කිසියම් තක්සේරු වර්ෂයක් තුළ අරමුදලට පරිත්‍යාගයක් කරන්නේ නම්, එම පරිත්‍යාගය 2021 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අරමුණු සඳහා අනුමත වියදමක් ලෙස සලකනු ලබන අතර, පරිත්‍යාග කරන්නාට එවැනි පරිත්‍යාගයක මුළු වටිනාකම සම්බන්ධයෙන් වන එම පනත යටතේ සහන සඳහා හිමිකම් ඇත.

මේ යටතේ කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ අරමුදලේ නිලධාරීන් ආරක්ෂා කිරීම

**13.** (1) මෙම පනතේ අරමුණු සඳහා පත් කරන ලද අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට හෝ කිසියම් නිලධාරියෙකුට, සේවකයෙකුට හෝ නියෝජිතයෙකුට, එරෙහිව, මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ මඟපෙන්වීම මත සාමාජිකයා, නිලධාරියා, සේවකයා හෝ නියෝජිතයා සද්භාවයෙන් කරන ලද හෝ සිදු කිරීමට අරමුණු කළ යම් ක්‍රියාවක් සඳහා කිසිදු නඩුවක් හෝ නඩු පැවරීමක් නොකළ යුතු ය.

(2) කිසියම් අධිකරණයක් ඉදිරියේ අරමුදල විසින් හෝ ඊට එරෙහිව ගෙන එන ඕනෑම නඩුවකදී හෝ නඩු පැවරීමකදී අරමුදල විසින් දරනු ලබන ඕනෑම වියදමක් අරමුදලින් ගෙවිය යුතු අතර, එම නඩුවකදී අරමුදලට ගෙවන ලද හෝ නැවත ආවරණය කරනු ලබන ඕනෑම වියදමක් අරමුදලට බැර කළ යුතු ය.

(3) මෙම පනත යටතේ හෝ මණ්ඩලයේ මඟපෙන්වීම මත, පුද්ගලයෙකු විසින් කරන ලද හෝ කිරීමට අරමුණු කළ ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව සියලු අධිකරණ ඉදිරියේ පනවා ඇති ඕනෑම නඩුවක හෝ නඩු පැවරීමක (1) උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි යම් පුද්ගලයකු විසින් දරන ලද ඕනෑම වියදමක් එවැනි ක්‍රියාවක් සද්භාවයෙන් සිදු කර ඇති බව අධිකරණය තීරණය කරන්නේ නම්, එම නඩුව හෝ නඩු පැවරීමකදී ඔහු විසින් එම වියදම අයකර නොගන්නේ නම්, අරමුදලෙන් ගෙවිය යුතු ය.

අරමුදල් පනතේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ හෝ නිලධාරියකුගේ පුද්ගලයාට හෝ දේපළවලට එරෙහිව රීට් ආඥාවක් නිකුත් කිරීමට නොහැක

**14.** අරමුදලට එරෙහිව ගනු ලබන ඕනෑම නඩුවකදී මණ්ඩලයේ කිසිඳු සාමාජිකයෙකුට හෝ අරමුදලේ නිලධාරියෙකුට, සේවකයෙකුට සහ නියෝජිතයෙකුට එරෙහිව පුද්ගලයෙකුට හෝ දේපලකට එරෙහිව රීට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

**අරමුදලේ නිලධාරීන් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහ පනත යටතේ රාජ්‍ය සේවකයින් ලෙසට සැලකෙන බව**

**15.** අරමුදලේ සියලු නිලධාරින් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහ පනතේ අර්ථය තුළ සහ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය සේවකයින් ලෙසට සැලකිය යුතු වන්නේ ය.

**අරමුදල අල්ලස් පනතේ අර්ථය තුළ උපලේඛණගත ආයතනයක් ලෙසට සැලකෙන බව**

**16.** අරමුදල අල්ලස් පනතේ අර්ථය තුළ උපලේඛණගත ආයතනයක් ලෙසට සැලකිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුත්තේ ය.

**මේ පනතේ විධිවිධාන ඔප්පුවේ විධිවිධානවලට වඩා බලපැවැත්වෙන පරිදි පැවතීම**

**17.** ඔප්පුවේ කුමන කරුණු අඩංගුව තිබුණද මෙම පනතේ විධිවිධානවලට බලපෑමක් නොවිය යුතු අතර, ඒ අනුව මෙම පනතේ විධිවිධාන සහ ඔප්පුවේ විධිවිධාන අතර කිසියම් ගැටුමක් ඇති වුවහොත්, මෙම පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**ජනරජයේ සහ අනෙකුත් අයගේ අයිතිවාසිකම් සුරැකීම**

**18.** මෙම පනතේ සඳහන් අයවලුන් සහ ඔවුන් මගින් සහ යටතේ හිමිකම් පාන අයවලුන් හැර, මෙම පනතේ අඩංගු කිසිවක් තුළින් ජනරජයේ හෝ ඕනෑම දේශපාලනික හෝ සංස්ථාපිත ආයතනයක හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ අයිතිවාසිකම්වලට අගතියක් හෝ බලපෑමක් ඇති නොකළ යුත්තේය.

**අර්ථ නිරූපණය**

**19.** මෙම පනතේ "නිර්මාතෘ" යන්නෙන් අදහස් වන්නේ ජීවිත කාලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන ඔප්පුවේ පූර්විකාවේ තුන්වන ඡේදයේ සඳහන් වන පුද්ගලයා වන අතර, ඔහුගේ මරණය හෝ විශ්‍රාම යාමෙන් අදහස් කළ යුත්තේ ඔහු විසින් නම් කරන ලද පැවරුම්කරුවෙකු ඔහු වෙනුවට පත් කළ යුතු බවයි.

"බලයලත් ආයෝජන" යන්නට ඕනෑම ස්ථාවර තැන්පතු, රජයේ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ රජයේ පිටුබලය ලබන වෙනත් ආයෝජන ඇතුළත් වේ.

"බැංකුව" යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා රජය යටතේ පිහිටුවා ඇති ඕනෑම රාජ්‍ය බැංකුවක් හෝ ඉතිරි කිරීමේ බැංකුවකි.

"භාර ඔප්පුව" යන්නෙන් අදහස් කරන්නේ, එනයින් සංස්ථාපිත හෝ ලියා සහතික කරන ලද ඕනෑම පරිපූරක හෝ සංශෝධිත සාධන පත්‍රයක් ඇතුළුව නිසි ලෙස ලියා සහතික කරන ලද ඔප්පු ය.

"භාරකරු" යන්නට භාර කාලය තුළ මුල් භාරකරුවන්, ආදේශක භාරකරුවන් හෝ අතිරේක භාරකරුවන් ඇතුළත් වේ.

"භාර අරමුදල" යන්නට මූලික අරමුදල, පසු අරමුදල් සහ භාරකරුවන් විසින් මූලික අරමුදලේ, පසු අරමුදල්වල ඕනෑම පොලී ඇතුලුව භාරකරුවන් විසින් ජනනය කරන ලද අනෙකුත් සියලුම ආදායම් සහ වියදම්, ඇතුළත් වේ.

මෙම භාරයේ මූලික භාර අරමුදල මිලියන 10 කි.

"පුද්ගලයා" යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක සිටින ඕනෑම පුද්ගලයෙකි. එයට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු හෝ නීතිමය ආයතනයක් ද ඇතුළත් වේ.

"ප්‍රතිලාභීන්" අතරට තම උසස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි ප්‍රාථමික අධ්‍යාපනය සතුටුදායක ලෙස නිම කළ සුදුසුකම් ඇති තරුණ තරුණියන් ඇතුළත් වන අතර කුසලතා හා නිපුණතා සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සඳහා වැඩිදුර එවැනි කටයුතුවල නියැලී සිටින ආචාර්යවරුන්, ගුරුවරුන් සහ එවැනි පුද්ගලයින් ඇතුළත් වේ.

"වසර" යනු ඔප්පුවේ පූර්විකාවේ සඳහන් පරිදි එක් ලිත් වර්ෂයකි.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**20.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව